NSSU-2015/GEOG/01
Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ජ්‍යොතිෂ ඥාණයෙහි ප්‍රායෝගික ව්‍යවහාරය : ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරිනි.

***ඩබ්.පී.ගීතිකා ප්‍රභාෂිණී ගුණරත්න.***[1]

**සංක්ෂේපය**

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනතාවගේ ජන ජීවිතය තුළ ජ්‍යොතිෂ ඥාණයෙහි ප්‍රායෝගික ව්‍යවහාරය සිදු වන්නේ කෙසේද? යන ගැටළුව ඔස්සේ සිදු කළ මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ මෙම ප්‍රදේශයේ ජන ජීවිතය තුළ ජ්‍යොතිෂ ඥාණයෙහි ප්‍රායෝගික ව්‍යවහාරය කුමන අයුරින් පවතින්නේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමයි.

මෙහිදී ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සංගහනය වශයෙන් ද, එහි ග්‍රාමසේවා වසම් හතරක් නියැදිය වශයෙන්ද තෝරාගෙන ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී සමීක්ෂණ ක්‍රමය යොදා ගත් අතර තොරතුරු ලබා ගැනීම උදෙසා ප්‍රශ්නාවලී ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ක්‍රමය යන ශිල්ප ක්‍රම භාවිතයට ගැනුණි. මෙහිදී ජ්‍යොතිෂවේදීන් හා ඔවුන්ගෙන් සේවා ලබා ගන්නා පුද්ගලයින් මෙන්ම සාමාන්‍ය පුද්ගලයින් ද පර්යේෂණයට භාජනය කරන ලදී.

ලංකාවේ ජනයාගෙන් යම් පිරිසක් මේ පිළිබඳ විශ්වාසයෙන් කටයුතු කරන අතර තවත් පිරිසක් මෙය අවඥාවට ලක් කරනු ලැබේ. ජ්‍යොතිෂ විද්‍යාව පිළිබඳව අල්ප දැනුමක් ඇති පිරිස ජ්‍යොතිෂවේදීන් ලෙස කටයුතු කර සමාජය මුලා කිරීම මෙසේ ජ්‍යොතිෂය හෑල්ලුවට ලක් වීමට බලපා ඇති කරුණකි. සිංහල බෞද්ධ බොහෝ පිරිසක් නම් තැබීම, අකුරු කියවීම, මල්වර උත්සවය, විවාහ උත්සවය හා ගෘහ නිර්මාණය ආදී කටයුතු සඳහා ජ්‍යොතිෂය භාවිත කරති. ජනයා තම හඳහන බලා ගැනීම සඳහා පෙළඹෙන්නේ තමාට දුක් කරදර වැඩි වූ අවස්ථාවන්හිදී බව ද මෙහිදී පෙනී ගිය කරුණකි. වර්තමානය වන විට අපල සඳහා යන්ත්‍ර දැමීම වෙනුවට මාණික්‍ය මුදු පැළඳීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී තිබෙන්නේ එය සමාජයේ විලාසිතාවක් බවට ද පත්වීම මඟිනි. මෙහිදී අනාවරණය වූ තවත් කරුණක් වනුයේ සමාජයේ යම් කොටසක් ජ්‍යොතිෂය හෑල්ලුවට ලක් කරමින් විවේචනය කරන බවයි. නමුත් ඔවුන් වුවද අනෙක් කුමන අවස්ථාවකදී ජ්‍යොතිෂය භාවිත නොකළද විවාහ මංගල්‍ය චාරිත්‍රවලදී ඒ ආකාරයෙන්ම ජ්‍යොතිෂ විද්‍යාව භාවිත කරන බව පෙනී ගිය කරුණකි. මේ සඳහා හේතු සාධක වී ඇත්තේ පාරම්පරික සිරිත් අනුගමනය කිරීමයි.

මේ අනුව නිගමනය කළ හැකි වන්නේ සිංහල ජනයාගෙන් වැඩි පිරිසක් ජ්‍යොතිෂය සම්පූර්ණයෙන්ම සත්‍ය යැයි පිළිනොගනිති. එහෙත් එය සම්පූර්ණයෙන්ම අසත්‍ය යැයි ද ප්‍රතික්ෂේප නොකරති. වැඩි දෙනා තම ජීවිතයේ බොහෝ කටයුතු සඳහා ජ්‍යොතිෂය අදාළ කර ගනිති. මුස්ලිම් ප්‍රජාව ජ්‍යොතිෂය භාවිත කිරීම කිසිසේත්ම සිදු නොකරන බවද මෙහිදී අනාවරණය විය. මේ අනුව කිව යුතු වන්නේ මේ පිළිබඳ පර්යේෂණ සිදු කර සැබෑ තත්වය සොයා ගන්නා තෙක් ජ්‍යොතිෂ්‍ය විද්‍යාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමක් සිදු නොකර ආරක්ෂා කර ගත යුතු බවයි. ඒ සඳහා ජ්‍යොතිෂ්‍ය විද්‍යාව පාසල් විෂය ධාරාවට සහ විශ්වවිද්‍යාල විෂය පථයට එක් කරමින් විද්‍යාත්මක පර්යේෂණ වටපිටාවක් ඇති කිරීම පිණිස රජය මැදිහත් වී කටයුතු කිරීමට සුදුසු කාලය එළඹී ඇත.

**ප්‍රමුඛ පද: ජ්‍යොතිෂය, ජ්‍යොතිෂ විද්‍යාව, ජ්‍යොතිෂ ඥාණය, ජ්‍යොතිෂ ව්‍යවහාරය**

1. *ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*